**මොරටුව විශ්වවිද්‍යාලය - 2015**

**-------------------------------------**

මොරටුව විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වන වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

(i) ජංගම වගකීම් ලෙස වර්ගීකරණය සඳහා අස්තිත්වයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල දී නිරවුල් කිරීමට අපේක්ෂා කරන, මූලික වශයෙන් වෙළඳ කටයුතු සඳහා තබාගෙන සිටින සහ වාර්තා කරන දිනෙන් මාස 12 ක් ඇතුලත දී නිරවුල් කිරීම යන නිර්ණායක පදනම් කර ගත යුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු රු.37,251,802 ක වෙනත් වගකීම් වලින් තෝරාගත් නියැදියක් පරීක්ෂා කිරීමේ දී ඉහත නිර්ණායක වලින් බැහැරව රු.26,811,444ක් වටිනා අයිතමයන් 11ක් ජංගම වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ii) ගිණුම්කරණ ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර ආදායම් හා වියදම් හිලව් නොකලයුතු නමුත් විශ්වවිද්‍යාලය වෙත ලද උපාධි ප්‍රදාන ගාස්තු හා යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු ආදායමින් වියදම හිලව් කර තිබුණි. මෙම ආදායම, ආදායම් ප්‍රකාශනයේ දක්වනවා වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්භිත ආදායම් ලෙස දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

සමාලෝචිත වර්ෂය තුලදී විවිධ අරමුදල් වෙත ලැබීම් සහ ඒ සඳහා වූ වියදම් මූල්‍ය ලැබීම් හා ගෙවීම් වශයෙන් වෙන් වෙන්ව හඳුනා නොගෙන විවිධ අරමුදල්වල ශුද්ධ වෙනස්වීම් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්රමිත 03**

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,971,794,094 ක්වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන වියදම් සඳහා ලබාදෙන ප්‍රදාන ඉක්මවා වැය කළ මුදල් භාණ්ඩාගාරය විසින් නැවත ප්‍රතිපූරණය කරන බව තහවුරු කරගැනීමෙන් තොරව ලැබිය යුතු මුදලක්

ලෙස දක්වා තිබුණි. වාර්ෂිකව මෙසේ ප්‍රතිපූරණය නොකර ණයගැතියන් ලෙස දක්වා තිබුණු සමුච්චිත ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට රු.66,947,710ක් විය.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණු රු.1,737,326ක වෙනත් ප්‍රාග්ධන ලැබීම් පිළිබඳ උපලේඛනය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.2.4 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගණුදෙනු හෙළිදරව් නොකිරීම**

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල පිහිටුවා තිබූ Uni Consultancy Services නමැති පුද්ගලික සමාගමට තොරතුරු තාක්ෂණ බාහිර පාඨමාලාවේ (BIT) ආදායමින් රු.2,943,373 ක කළමනාකරණ ගාස්තු කිසිදු ගිවිසුමකින් තොරව ගෙවා තිබුණි. මෙම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් සහ විශ්වවිද්‍යාල පරිපාලන හා මූල්‍ය කටයුතුවලට සම්බන්ධ ඉහළ විධායක නිලධාරීන්ගෙන් සමන්විත වී තිබූ අතර ඒ බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම**

ගිවිසුම් හා බැඳුම්කර කඩකළ ආචාර්යවරුන් 38 දෙනෙකුගෙන් 2015 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු වටිනාකම රු. 54,739,462 ක් විය. ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම හේතුවෙන් නිලධාරීන් 21 දෙනෙකුගෙන් අය කළ යුතු රු.31,136,898 ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදු කර නොතිබූ අතර ඒ තුල නිලධාරීන් 13 දෙනෙකුගෙන් අය විය යුතු රු. 16,110,522 ක් වසර 10 කට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි.

(ii) ගිවිසුම් කඩකළ නිලධාරීන් 08 දෙනෙකුගෙන් අය විය යුතු රු.14,978,567 ක් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලින් අය කර ගැනීමට අදාල නිලධාරීන් විසින් අනුමැතිය දී තිබුණ ද 2015 දෙසැම්බර් 31 වන විටත් එම මුදල් අය කර ගෙන නොතිබුණි.

**(ආ)** 2015 දෙසැම්බර් 31 දිනට පැවති ණයහිමි ශේෂය තුල මාස 04 සිට මාස 51ක පමණ කාලයක් තුළ නිරවුල් නොකළ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු රු. 5,849,743 ක ශේෂයක් විය.

2.4 **නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) XII පරිච්ඡේදයෙහි 15.10 උපවගන්තිය හා XXIV පරිච්ඡේදයෙහි 3.18 උපවගන්තිය | නිලධාරියෙකුට වැටුප් රහිත නිවාඩු ලබා දෙන විට නිලධාරියාට යම් කිසි ණය මුදලක් දී තිබේ නම් එම මුදල් අය කර ගැනීමට සුදුසු විධිවිධාන යෙදීමට ආයතන ප්‍රධානියා වග බලා ගත යුතු අතර, විදේශ රැකියාවක් සඳහා යාමට වැටුප් රහිත නිවාඩු ඉල්ලුම් කළ නිලධාරියෙකු තමා එම නිවාඩු ලබා ගැනීමට පෙර ණය මුදල ගෙවා දැමිය යුතුය. කෙසේ වුවද, විශ්වවිද්‍යාලයේ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන සිටි නිලධාරීන් 08 දෙනෙකුගෙන් අය විය යුතු රු.447,213ක ණය සම්බන්ධයෙන් ඉහත විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි. |
| (ii) XXIV පරිච්ඡේදයෙහි 4.2.5 උපවගන්තිය | අපේක්ෂා කරන දිනට ප්‍රථමයෙන් නිලධාරීන්ගේ සේවය අවසන් වුවහොත් නිලධාරියාගේ ආපසු ගෙවා අවසන් කර නැති ණය මුදලකින් අය කර ගැනීමට ඉතිරිව තිබෙන මුදල පාරිතෝෂිත අරමුදල්වලින් හෝ අය කර ගත යුතු වුවත් සේවයෙන් ඉල්ලා අස්වූ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අය විය යුතු රු.427,213ක ණය සම්බන්ධයෙන් ඉහත විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 104 (3) හා (4) | රෙගුලාසි ප්‍රකාරව අලාභ වටිනාකම රු.1,642,139 ක් වූ වාහන අනතුර සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාව හා පූර්ණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 137, මුදල් රෙගුලාසි 226 (1) හා මුදල් රෙගුලාසි 264 | 2015 ජූලි මස පුනරාවර්තන වියදම් නියැදි පරීක්ෂාවේ දී රු.3,126,117ක් වටිනා වවුචර් 19 ක් අනුමත කිරීමෙන් තොරව ද, රු.6,792,653ක් වටිනා වවුචර් 35 ක් වවුචර්වල නියමිත අධිකාරිය සඳහන් කිරීමෙන් තොරවද හා රු.1,450,406ක් වටිනා වවුචර් 24 ආදායකයාගෙන් මුදල් ලැබුණු බවට කුවිතාන්සියක් ලබා ගැනීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. |
| **(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය** | |
| XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණි වේලාව හා පිටව යන වේලාව පැමිණීමේ ලේඛනවල සටහන් කළ යුතු නමුත් අධ්‍යයන කාර්යමණ්ඩලය පැමිණීම හා පිටවීම අත්සන් කර නොතිබුණි. එබැවින් පැමිණීම හා පිටවීම අත්සන් තහවුරු කර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ |

අධ්‍යයන කාර්ය මණ්ඩලයට රු.809,992,941ක පාරිශ්‍රමික ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.220,259,676ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.241,609,866ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.21,350,190කින් අඩුවී තිබුණි. වියදම රු.364,390,915 කින් වැඩිවී තිබුණද ආදායම රු.385,741,105 කින් වැඩිවීම නිසා ඉහත ඌනතාවය අඩුවී තිබුණි.

ඉකුත් වර්ෂ කිහිපයක මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී අඛණ්ඩව මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමක් සිදුවී තිබූ අතර 2011 වර්ෂයේ රු.32,112,865ක්වූ ඌනතාවය 2015 වර්ෂයේ රු.220,259,676ක් බවට පත්වී තිබුණි. වියදම්වලට ප්‍රමාණවත් පුනරාවර්තන ප්‍රදාන නොලැබීම හා වෙනත් ආදායම් මාර්ග කෙරෙහි අවධානය යොමු නොකිරීම මෙවැනි තත්ත්වයකට හේතුවී තිබුණි. කෙසේ වුවද, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් හා බදු ගෙවීම් සැළකිල්ලට ගැනීමේදී දායකත්වය අතිරික්තයක් වී තිබුණි. 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එය අඛණ්ඩව වර්ධනය වී තිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එහි වැඩිවීම සියයට 24 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය තුළදී ඉංජිනේරු, වාස්තු විද්‍යා සහ තොරතුරු තාක්ෂණ පීඨ සඳහා පිළිවෙලින් සිසුන් 928 ක්, 358 ක් හා 288 ක් බඳවාගෙන තිබූ අතර පසුගිය වර්ෂ 05 ක් සලකා බැලීමේදී සිසුන් බඳවා ගැනීමේ ක්‍රමික වර්ධනයක් තිබුණි. 2011 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ඉංජිනේරු, වාස්තු විද්‍යා හා තොරතුරු තාක්ෂණ පීඨවලට සිසුන් බඳවා ගැනීමේදී පිළිවෙලින් සියයට 10 ක සියයට 17 ක හා සියයට 38 ක වර්ධනයක් දක්නට ලැබුණි.

(ආ) 2015 වර්ෂය සඳහා සිසුන් 3403 ක් නේවාසිකාගාර පහසුකම් ඉල්ලා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ සිසුන් 1107ට එනම් ඉල්ලුම් කළ සිසුන්ගෙන් සියයට 32 කට පමණක් නේවාසිකාගාර පහසුකම් සලසා තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවය අතහැර ගිය නිලධාරීන් සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 7.2 වගන්තිය ප්‍රකාරව කඩිනමින් කටයුතු නොකිරීම නිසා සේවය හැර ගොස් සිටි නිලධාරීන් හතරදෙනෙකුට ඒ බව දැනුම් දීමට අවුරුදු 1 මාස 03 ක කාලයක් ගත වී තිබුණි.

(ආ) පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා 2012 අප්‍රේල් 06 සිට 2015 අප්‍රේල් 30 දක්වා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාගත් නිලධාරියෙකු අදාල පශ්චාත් උපාධි කටයුතු සම්පූර්ණ

කිරීමකින් තොරව නැවත වරක් 2015 පෙබරවාරි 05 දින සිට විශ්වවිද්‍යාලයේ සේවයට වාර්තා කර තිබුණි. නමුත් පශ්චාත් උපාධි කටයුතු සඳහා නිවාඩු ලබා ගැනීමේ දී ඇති කර ගනු ලබන ගිවිසුමේ 14(අ) ඡේදය ප්‍රකාරව අදාල නිලධාරියාගෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතු රු.1,848,272ක මුදල සමාලෝචිත වර්ෂය අවසානයටත් අය කරගෙන නොතිබුණි.

(ඇ) අවස්ථා කීපයකදීම ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබියදී සහ ඵලදායී ලෙස සේවය ලබාදී නොතිබුණු බව නිරීක්ෂණය වී තිබියදීත් 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අඛණ්ඩව විශ්වවිද්‍යාලයේ ආරක්ෂක කටයුතු පවත්වාගෙන යාම සඳහා පුද්ගලික ආරක්ෂක සේවා සමාගමක් සමග ගිවිසුම් ගතව කටයුතු කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී ඒ වෙනුවෙන් රු.18,838,760 ක ගෙවීම් කර තිබුණි.

(ඈ) 1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාල විසින් පවත්වනු ලබන විභාගයන්හි ප්‍රතිඵල මාස 03 කාලයක් තුල නිකුත් කළ යුතු බව දන්වා ඇති නමුත් 2014 සහ 2015 අධ්‍යයන වර්ෂවලට අදාලව පවත්වා තිබූ විභාග 143න් විභාග 102ක ප්‍රතිඵල නිකුත් කිරීම මාස 03 සිට මාස 20ක් දක්වා ප්‍රමාදවී තිබුණි. ඒ අනුව විභාග ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාදවීම සමස්ථයක් ලෙස ගත්කළ සියයට 71ක් වැනි ඉහල අගයක් ගෙන තිබුණි.

## 4.3 අරමුදල් උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම වෙනුවෙන් පිහිටුවා ඇති රු.11,781,905 ක අරමුදල් 61කින් කිසිදු ශිෂ්‍යත්වයක් සමාලෝචිත වර්ෂය තුල පිරිනැමීමට කටයුතු කර නොතිබූ අතර රු.7,719,399 ක අරමුදල් 40කින් කිසිදු ශිෂ්‍යත්වයක් පසුගිය වර්ෂ 05 තුල පිරිනැමීමට කටයුතු කර නොතිබුණි. අපේක්ෂිත සාධන මට්ටම සපුරා නොමැති බැවින් අදාල ශිෂ්‍යත්ව ප්‍රදානය කළ නොහැකි බව උපකුලපති විසින් විගණනයට දන්වා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ පශ්චාත් උපාධි සඳහා රජයෙන් ලද රු.2,004,487ක ප්‍රදානයක් 2007වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ රු.1,426,994 ක් වැය කර ඉදිකර තිබූ කැලිකසල බහාලන ස්ථානය සැලසුම් කළ පරිදි ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අපහරණය කිරීමකින් තොරව රු.925,000 ක් පිරිවැය වූ මෝටර් රථයක් 2013 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර ස්වාභාවික ආපදාවන්ට ලක්වන පරිදි විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

## 4.5 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් සහ ගොඩනැගිලි

මොරටුව විශ්වවිද්‍යාලය පවත්වාගෙන යන පොත් අගය රු.260,843,500 ක්වූ රජයට අයත් අක්කර 55 ක වපසරියක් ඇති ඉඩම හා විශ්වවිද්‍යාලය විසින් ප්‍රයෝජනයට ගනු ලැබුවද පෙර අයිතිකරුගේ නමින් විශ්වවිද්‍යාලය විසින් වරිපනම් බදු ගෙවීම සිදුකරනු ලබන දේපල 05 ක් විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශයට විගණනය සම්බන්ධව වෘත්තීය නිපුණත්වයක් ඇති නිලධාරීන් ප්‍රමාණවත් ලෙස බඳවා ගෙන අනුයුක්ත කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 133 (අ) සහ (ආ) ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක ප්‍රධාන පරමාර්ථයක් ලෙස හා අභ්‍යන්තර විගණන ඒකක වල කාර්යයන් ලෙස ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රමවල ප්‍රගතිය නිශ්චය කිරීම, ව්‍යාපෘති සම්බන්ධව ගැටලු ක්ෂේත්‍රයන් සලකා බැලීම් සහ ස්ථානීය පරීක්ෂා කිරීම් සිදු කිරීම යනාදිය සිදු කළ යුතු වුවත් ප්‍රමාණවත් ලෙස ඒ පිළිබඳව කටයුතු කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 05 ක අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 21 සිට සියයට 174 දක්වා විචලනයන් නිරීක්ෂණය වීමෙන් හා ශිෂ්‍ය කුසලතා වර්ධනය කිරීම සඳහා ප්‍රාග්ධන උපවැය විෂයයන් 5ක් යටතේ වෙන්කර තිබූ රු.9,000,000ක මුදල ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගෙන තිබීමෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | - ප්‍රයෝජනවත් ජීවිත කාලය හඳුනාගැනීමේදී සිදුවූ දෝෂ නිවැරදි නොකිරීම.<br>- ඉඩම් දේපළ වල අයිතිය පවරා නොගැනීම. |
| (ආ) | අත්තිකාරම් පාලනය | - කාර්යය නිම වූ පසු අත්තිකාරම් පියවීමට කටයුතු නොකිරීම. |